*Vidvān - Ruhuna Undergraduate Academic Journal of Pali and Buddhist Studies*
*Volume I , Issue I*
*ISSN: 3121-5033*

# පශ්චාත් බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායන් පිළිබඳව කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

**යක්කලමුල්ලේ සුගුණරංසි හිමි**
**පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
a21ai915@arts.pdn.lk

**සාරසංක්ෂේපය**

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව පැනනැගුණු විවිධ නිකායික මතවාද, අභ්‍යන්තර හා බාහිර දාර්ශනික අභියෝග මෙන්ම සමකාලීන භාරතීය ආගමික ප්‍රවණතාවලට ප්‍රතිචාර දැක්වීමේ ප්‍රතිඵලයක් ලෙස බුදුදහම තුළ විවිධ දාර්ශනික සම්ප්‍රදායන් ප්‍රභවය විය. මෙම පර්යේෂණය මඟින් මුල් බුදු සමයේ ඉගැන්වීම් පදනම් කරගෙන විකාශනය වූ චතුර්විධ බෞද්ධ සම්ප්‍රදායන් වන සර්වාස්තිවාදී (වෛභාෂික), සෞත්‍රාන්තික, මාධ්‍යමික සහ යෝගාචාර යන සම්ප්‍රදායන්හි දාර්ශනික හා ව්‍යවහාරික ලක්ෂණ විමර්ශනය කෙරේ. චතුර්විධ බෞද්ධ සම්ප්‍රදායන්ගේ දාර්ශනික මූලධර්ම සහ ප්‍රායෝගික ව්‍යවහාරයන් අධ්‍යයනය කිරීමේදී ඒවා අතර පවතින සංකීර්ණ සබඳතා සහ සුවිශේෂී අනන්‍යතාවන් කවරේද යන්න හඳුනාගැනීම මෙහි ගැටලුවයි. මෙම සම්ප්‍රදායන්හි ඓතිහාසික පරිණාමය, දාර්ශනික මතවාද සහ ඒවායේ අඛණ්ඩ පැවැත්මට බලපෑ හේතු සාධක පුළුල් සංසන්දනාත්මක විශ්ලේෂණයකට ලක් කිරීම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ත්‍රිපිටකාගත ග්‍රන්ථ ද, ද්විතීයික මූලාශ්‍රය ලෙස පශ්චාත්කාලීන ශාස්ත්‍රීය පර්යේෂණ කෘති සහ ලිපි ද උපයෝගී කරගනිමින්, ගුණාත්මක දත්ත පාදක සාහිත්‍යමය පර්යේෂණ විධික්‍රමය අනුගමනය කර ඇත. මෙම අධ්‍යයනයට අනුව, පළමු හා දෙවන සංගායනාවලින් පසු ඇති වූ නිකායභේදය සහ කණිෂ්ක රාජ්‍ය සමයේ පැවැති සතරවන ධර්ම සංගායනාව චතුර්විධ සම්ප්‍රදායන්ගේ ස්වාධීන විකාශනයට ඍජුවම බලපා ඇත. කාලත්‍රයවර්තී ධර්මයන්හි පැවැත්ම පිළිගත් සර්වාස්තිවාදයත්, අභිධර්මය බැහැර කරමින් සූත්‍ර පමණක් ප්‍රාමාණික කරගත් සෞත්‍රාන්තිකයත් ථෙරවාද ආභාසය සහිතව ගොඩනැගී ඇත. අනෙක් අතට, පටිච්චසමුප්පාදය මුල් කරගනිමින් ශූන්‍යතාවාදය ඉදිරිපත් කළ මාධ්‍යමික සම්ප්‍රදායත්, ලංකාවතාර සූත්‍රය හා මිනිස් සිත පිළිබඳ විමර්ශන ඇසුරින් ආලය විඥානය ප්‍රමුඛ කරගත් යෝගාචාර සම්ප්‍රදායත් මහායාන චින්තනය නියෝජනය කරයි. භික්ෂූන් වහන්සේලා විදර්ශනා ධුරයෙන් බැහැරව ග්‍රන්ථ ධුරයට සහ තර්කයට නැඹුරු වීම මෙන්ම අන්‍ය ආගමික මත ඛණ්ඩනය කිරීමට දැක්වූ උත්සාහය බෞද්ධ දර්ශනය මෙලෙස විවිධාංගීකරණය වීමට තුඩුදුන් ප්‍රධාන සාධක බව මෙමඟින් නිගමනය කෙරේ.

*ප්‍රමුඛ පද : සර්වාස්තිවාදය, සෞත්‍රාන්තික, මාධ්‍යමික, යෝගාචාර, දාර්ශනික විකාශනය*

**Article History:** 23.03.2026 **Accepted:** 30.06.2026


*© Editor in Chief: Dr. Ven. Koggalle Wijitha, Editor: Dr. Thusitha Rajapaksha*
*Vidvān, Department of Pali and Buddhist Studies,Faculty of Humanities and Social Sciences, University of Ruhuna, Sri Lanka.*

## 1. හැඳින්වීම

ක්‍රිස්තු පූර්ව හයවන සියවසයෙහි ඇති වූ බුදුදහම නූතනය වනවිට විවිධ සම්ප්‍රදායන් ඔස්සේ ව්‍යාප්තව ඇත. සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු පැවති පළමු සහ දෙවන සංගායනාවන්ගෙන් අනතුරුව බුදුදහම පසුබිම් කරගෙන විවිධ සම්ප්‍රදාය, ගුරුකුල ප්‍රභවය විය. දෙවන සංගායනාවෙන් පසුව බිහිවුණු මහාසාංඝික සම්ප්‍රදායේ ආරම්භයත් සමඟ මෙම විවිධ සම්ප්‍රදායන් හීනයාන සහ මහායාන යන ප්‍රධාන සම්ප්‍රදායන් දෙකක් ඔස්සේ ව්‍යාප්ත විය. ථෙරවාදය සහ මහායානය මූලික කරගනිමින් බිහි වුණු දර්ශනවාද ප්‍රධාන වශයෙන් හතරකි. මෙම සම්ප්‍රදායන් සතර 'චතුර්විධ බෞද්ධ සම්ප්‍රදායන්' ලෙස හඳුන්වනු ලැබේ. එනම් සර්වාස්තිවාදී, සෞත්‍රාන්තික, මාධ්‍යමික සහ යෝගාචාර යනුවෙනි. මෙහි සඳහන් පළමු සහ දෙවන සම්ප්‍රදායන් දෙක එනම් සර්වාස්තිවාදී සහ සෞත්‍රාන්තික සම්ප්‍රදායක් දෙක ථෙරවාදී සම්ප්‍රදායන් ලෙස පිළිගනු ලැබෙයි. මාධ්‍යමික සහ යෝගාචාර සම්ප්‍රදායන් මහායානයට අයත් සම්ප්‍රදායන් වෙයි. විවිධ බාධක මධ්‍යයයේ විකාශය වූ මූලික සංඝ සමාජය විවිධ නිකායන්ට බෙදීයාම හා එමගින් විවිධ දාර්ශනික සම්ප්‍රදායන් බිහිවීමට හේතුව වශයෙන් පෙන්වාදිය හැක්කේ මුල් බුදු සමයේ ඇතුළත් විවිධ ධර්මමය කරුණු අරහයා පශ්චාත් කාලීනව පැන නැගුණු මතවාදයන් බවය. මෙම මතවාදයන්ය. මූල් බුදු සමයේ දැක්වූ කරුණු දාර්ශනිකව විග්‍රහ කිරීමට විවිධ ආචාර්යවරුන් පෙළඹී ඇත. එමගින් විවිධ නිකායන් හා දාර්ශනික සම්ප්‍රදායන් ආරම්භ වූ බව අනුමාන කළ හැකි වේ. මෙයට අමතරව බුදු සමයට සමකාලීන අන්‍ය ආගමික සම්ප්‍රදායන්ගේ විශේෂයෙන් වේදාන්ත දර්ශනය වැනි දාර්ශනික මතවාදයන් හා සමානව බුදු සමයේ දාර්ශනික අංශය සංවර්ධනය කිරීමට ථෙරවාදී හා මහායානික තෙරවරුන් දැක්වූ උත්සාහය ද බුදු දහමේ විවිධ දාර්ශනික සම්ප්‍රදායන් ආරම්භ වීමට බලපෑ ප්‍රධාන සාධකයක් විය. එමෙන්ම විවිධ බෞද්ධ සම්ප්‍රදායන්හි පැවති තරඟකාරීත්වය ද බුදු දහමේ විවිධ දාර්ශනික සම්ප්‍රදායන් ආරම්භ වීමට හේතු සාධකයක් විය. මෙහිදි විවිධ බෞද්ධ සම්ප්‍රදායන් ස්වමතවාදයන්ට දාර්ශනික ස්වරූපයක් ගන්වා අනිකුත් බෞද්ධ මතවාදයන් අභිබවා යාමට උත්සහ ගෙන ඇත. මෙම සම්ප්‍රදායයන් දෙක එකිනෙක සම්ප්‍රදායයන් අභිබවා තම සම්ප්‍රදායයෙහි මතවාදයන්ට දාර්ශනික ස්වරූපයක් ලබාදීමට උත්සාහ ගෙන ඇත.

## 2. සාහිත්‍යය විමර්ශනය

මෙම පර්යේෂණයේ ප්‍රස්තුතය පිළිබඳ ව ශාස්ත්‍රීය පර්යේෂණ යම් ප්‍රමාණයක් සිදු වී ඇත. නමුදු එම සිදුකර තිබෙන පර්යේෂණයන් ද ඇසුරු කරගෙන මාගේ පර්යේෂණ ප්‍රස්තුතය පිළිබඳව වැඩිදුරටත් විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම මෙහිදී සිදු විය. මේ සඳහා ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ත්‍රිපිටකාගත ග්‍රන්ථයන් ද විවිධ උගතුන් විසින් සිදු කරනු ලැබූ පර්යේෂණයන් භාවිතා කෙරිණි.

### 3. පර්යේෂණ ගැටලුව

චතුර්විධ බෞද්ධ සම්ප්‍රදායන්ගේ දාර්ශනික මූලධර්ම සහ ප්‍රායෝගික ව්‍යවහාරය පිළිබඳව විමර්ශනය කිරීමේදී, ඒවා අතර පවතින සංකීර්ණ සම්බන්ධතා සහ සුවිශේෂී ලක්ෂණ මොනවාද යන්න අධ්‍යයනය කිරීම

### 4. පර්යේෂණ අරමුණ

විශේෂයෙන්ම චතුර්විධ බෞද්ධ සම්ප්‍රදායන්ගේ ඓතිහාසික පරිණාමය සහ දර්ශනික මතවාදයන් ගැන පුළුල් සංසන්දනාත්මක අධ්‍යයනයක යෙදීම, ඒවායේ අඛණ්ඩ පැවැත්මට හේතු සාධක විශ්ලේෂණය කිරීම

### 5. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා සාහිත්‍යය මූලාශ්‍ර අධ්‍යයනය කරමින් ගුණාත්මක දත්ත පාදක පර්යේෂණ විධික්‍රමය උපයෝගී කරගනු ලබයි.

### 6. ප්‍රතිඵල හා සාකච්ඡාව

#### 6.1 චතුර්විධ බෞද්ධ සම්ප්‍රදායේ ආරම්භය

බෞද්ධ දර්ශනයෙහි ප්‍රාරම්භය ගෞතම බුදුරජාණන් වහන්සේ පන්සාළිස් වසක් මුළුල්ලේ දේශනා කරන ලද ධර්මය පදනම් කරගෙන සිදුවූවකි. එහෙත් එය බුද්ධ පරිනිර්වාණයෙන් පසුව විවිධ වූ දාර්ශනික චින්තාවන් පදනම් කරගනිමින් සංවර්ධනය විය. විශේෂයෙන් නිකායාන්තර ධර්ම කාරණා සම්බන්ධයෙන් ගොඩ නැගුණු මතවාද ද සමයාන්තර ආගමික මතවාද කරණ කොටගෙන මෙසේ බෞද්ධ දර්ශනයෙහි ප්‍රභවය සිදුවිය. බෞද්ධ සමාජය දර්ශනය වශයෙන් ථේරවාද, මහායාන යැයි ප්‍රධාන විභජන දෙකකි. මේ දෙක අතරින් බුද්ධ ධර්මයේ බොහෝ තැන් සියුම්ව නිරීක්ෂණය කර විග්‍රහ කළාහු මහායානිකයෝය. ථේරවාදීහු බුද්ධ භාෂිත ශ්‍රී සද්ධර්මයම ප්‍රාමාණිකත්වයෙන් සළකා එයම බුද්ධ වචනයට අනුව විවරණය කළ අතර මහායානිකයෝ මූලික බුද්ධ වචනය සිය සම්ප්‍රදායේ මතවාද සමඟින්ම විවරණය කළහ.

ලෝකයේ ප්‍රධාන ආගම් දෙස බැලීමේ දී පෙනීයන වැදගත් කරුණක් නම් එම සෑම සමයක ම පාහේ නිකායන් හෙවත් සම්ප්‍රදායයන් බිහිවීම යි.

- බුදුසමය - ථේරවාද, මහායාන
- ක්‍රිස්තියානි සමය - කතෝලික, ප්‍රොතෙස්තන්ත
- ඉස්ලාම් සමය - ශුන්නි, ශියා
- හින්දු සමය - ශිව, විෂ්ණු (පඤ්ඤාරතන හිමි, 2018: 61)

මෙසේ සම්ප්‍රදායන් බිහිවීම සාමාන්‍ය තත්ත්වයකි. මෙම ප්‍රධාන ප්‍රභේදයන්ට අමතරව තවත් කුඩා බෙදීම් රාශියක් ඇති වූ අතර ධර්මයේ ව්‍යාප්තිය එම සම්ප්‍රදායන් බිහිවීමටත්, එම සම්ප්‍රදායන් බිහිවීම ධර්මයේ ව්‍යාප්තියටත් ඉවහල් වූ බව පෙනේ. ලොව කිසිදු ආගමක් හෝ දර්ශනයක් ආකස්මිකව පහළ නොවූ අතර සමකාලීන සමාජ හා ආර්ථික පරිසරය ඒ සඳහා ඉවහල් වූහ.

ක්‍රි. පූ. තෙවන සියවසසේ පටන් දහවන සියවස දක්වා ඉන්දියානු දර්ශනය විකාශය වුවද දස වැනි සියවසින් පසුව එහි බිඳවැටීමක් දැකිය හැකිය. මේ සියවස් අතර කාලයෙහි දාර්ශනික සිද්ධාන්තයන් ප්‍රසිද්ධ වශයෙන් තෙවරක්ම වෙනස් කර ඇත. එය තිවක්‍ර ප්‍රවර්තනය නම් වේ. එහි දී බහුත්වවාදයත්, අද්වෛතවාදයත්, ප්‍රත්‍යවාදයත් යන දර්ශනත්‍රය පිළිවෙලින් ගොඩනැගුණි. මින් ප්‍රථම යුගයේ දාර්ශනිකයන් අනාත්මවාදය පිළිගත් අතර දෙවන යුගයේදී විශ්වයේ සත්තාව සෘජුවම ප්‍රතික්ෂේප නොකර සත්‍යාවබෝධයට ප්‍රත්‍යක්ෂයත් තර්කයත් එක ලෙසම අවශ්‍ය යැයි පිළිගත්හ. තෙවන යුගයේ දී විඥානවාදය මුල් වූ දර්ශනයන්හි ප්‍රමුඛතාවක් දක්නට ලැබේ. ප්‍රථම යුගයේ ක්‍රි. පූ. තෙවන සියවසේ සිට ක්‍රි.ව. පළමුවන සියවස දක්වාත් දෙවන යුගය ක්‍රි. ව. පළමුවන සියවසේ සිට පස්වන සියවස දක්වාත් තෙවැන්න ක්‍රි.ව. පස්වන සියවසේ සිට දහවන සියවස දක්වාත් කාල වශයෙන් බෙදීම් කළ හැකිය. මෙසේ විකාශනයට පත් වූ බෞද්ධ දර්ශනය ප්‍රධාන වශයෙන් සම්ප්‍රදාය හතරකි.

- වෛභාෂික දර්ශන සම්ප්‍රදාය (සර්වාස්තිවාදී)
- සෞත්‍රාන්තික දර්ශන සම්ප්‍රදාය (බාහ්‍යාර්ථ අනුමේය වාදය)
- මාධ්‍යමික දර්ශන සම්ප්‍රදාය (ශූන්‍යතාවාදී)
- යෝගාචාර දර්ශන සම්ප්‍රදාය (විඥානවාදය) වශයෙනි. (රාහුල හිමි, 1957: 69)

මූලික බුදුසමයෙහි සඳහන් විවිධ ඉගැන්වීම් විවිධ විකල්පනයන් ඔස්සේ තව තවත් පුළුල් කිරීමට මහායාන හා ථේරවාද පඬිවරු උත්සහ ගත්හ. එහි උච්චතම අවස්ථාව ලෙස කණිෂ්ක රජුගේ දායකත්වය මත පැවැත් වූ සතරවන ධර්ම සංගායනාවෙන් පසු ස්වාධීන චින්තනයන් මගින් විවිධ දාර්ශනික සම්ප්‍රදායන් නිර්මාණය වීම සඳහන් කළ හැකිය. කණිෂ්ක සංගීතියෙන් අනතුරුව චතුර්විධ බෞද්ධ සම්ප්‍රදායන්ගේ ආරම්භය සිදුවී ඇති බව පැහැදිලි වේ.

මෙම සම්ප්‍රදායන් සතරෙහි ආරම්භය විමසීමේදී යෝගාචාර සම්ප්‍රදාය හා මාධ්‍යමික යන සම්ප්‍රදායන් මහායාන සම්ප්‍රදාය මගින් ද වෛභාෂික හා සෞත්‍රාන්තික සම්ප්‍රදායන් ථේරවාදය මගින් ද බිහි වී ඇති බව සාමාන්‍ය පිළිගැනීමයි. කෙසේ වෙතත් මේ පිළිබඳව පවතින මතවාදයන් පරස්පර විරෝධී වේ. නෛෂධීය චරිතය ලියූ ශ්‍රී හර්ෂ දේවයෝ පවසනුයේ මෙම සම්ප්‍රදායන් සතර අතරින් වෛභාෂිකයෝ හීනයානයටද සෙසු සම්ප්‍රදායන් මහායානයටද අයත් බවයි. නමුත් ආචාර්ය රාධක්‍රිෂ්ණ පඬිතුමා මුලින් දක්වන ලද මතය පිළිගනී. (සාසනරතන හිමි, 1962: 297)

කෙසේ වෙතත් මෙම බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායන්ගේ පහළවීමට බලපෑ මූලික සම්ප්‍රදායන් පිළිබඳව උගතුන් අතර විවිධ මතවාද ඇතත් බොහෝ විද්වතුන්ගේ අදහස වන්නේ මුලින් දැක් වූ මතයයි.

විශේෂයෙන්ම විවිධ බාධක මධ්‍යයේ විකාශනය වූ මූලික සංඝ සමාජය විවිධ නිකායන්ට බෙදීයාම හා එමගින් විවිධ දාර්ශනික සම්ප්‍රදායන් බිහිවීමට හේතුව වශයෙන් පෙන්වාදිය හැක්කේ මූලික බුදු සමයේ සඳහන් විවිධ ධර්මමය කරුණු අරභයා පශ්චාත් කාලීනව පැන නැගුණු මතවාදයන් බවය. මෙම මතවාදයන් මූලික බුදු සමයේ දැක්වූ කරුණු දාර්ශනිකව විග්‍රහ කිරීමට විවිධ ආචාර්යවරුන් පෙළඹී ඇත. එමගින් විවිධ නිකායන් හා දාර්ශනික සම්ප්‍රදායන් ආරම්භ වූ බව අනුමාන කළ හැකි වේ. මෙයට අමතරව බුදු සමයට සමකාලීන අන්‍ය ආගමික සම්ප්‍රදායන්ගේ විශේෂයෙන් වේදාන්ත දර්ශනය වැනි දාර්ශනික මතවාදයන් හා සමානව බුදුසමයේ දාර්ශනික අංශය සංවර්ධනය කිරීමට ථෙරවාදී හා මහායානික තෙරවරුන් දැක්වූ උත්සාහය ද බුදු දහමේ විවිධ දාර්ශනික සම්ප්‍රදායන් ආරම්භ වීමට බලපෑ ප්‍රධාන සාධකයක් විය. එමෙන්ම විවිධ බෞද්ධ සම්ප්‍රදායන්හි පැවති තරගකාරීත්වය ද බුදු දහමේ විවිධ දාර්ශනික සම්ප්‍රදායන් ආරම්භ වීමට හේතු සාධකයක් විය. මෙහි දී විවිධ බෞද්ධ සම්ප්‍රදායන් ස්වමතවාදයන්ට දාර්ශනික ස්වරූපයක් ගන්වා අනිකුත් බෞද්ධ මතවාදයන් අභිබවා යාමට උත්සහ ගෙන ඇත. මෙහිදී ථෙරවාද සම්ප්‍රදාය හා මහායානික සම්ප්‍රදාය වැදගත් වේ. මෙම සම්ප්‍රදායන් දෙක එකිනෙක සම්ප්‍රදායන් අභිබවා තම සම්ප්‍රදායෙහි මතවාදයන්ට දාර්ශනික ස්වරූපයක් ලබාදීමට උත්සාහ ගෙන ඇත. (මේධානන්ද හිමි, 1988: 21)

මේ ආකාරයට විවිධ හේතු මත පදනම් වී බුදු සමය තුළ ඇති වූ මෙම දාර්ශනික සම්ප්‍රදායන්ගේ විකාශයට හා සංවර්ධනයට විවිධ හේතු සාධක පදනම් විය. බුදුසමය අටලොස් නිකායකට බෙදී යාම බුදු සමයේ සංවර්ධනයට ඉවහල් වූ බව පැහැදිලි කරුණකි. විශේෂයෙන් මෙම නිකායිකයන් අතරේ විවිධ කරුණු අරභයා ඇති වූ දාර්ශනික මතභේද මගින් ඔවුහු සිය දාර්ශනික චින්තාවන් දියුණුකොට ඇත. ථෙරවාදීන් කථාවත්ථුප්පකරණය රචනා කරනුයේ පරවාද මතනය සඳහාය. එමෙන්ම මිලින්ද පඤ්හය වැනි ගැඹුරු දාර්ශනික ග්‍රන්ථ රචනා වනුයේ අබෞද්ධ දාර්ශනික සම්ප්‍රදායන්හි මතවාද ඛණ්ඩනය කිරීම සදහා ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි. එමෙන්ම අබෞද්ධ දාර්ශනික සම්ප්‍රදායන්හි මතවාද ඛණ්ඩනය කිරීම සඳහා විවිධාකාරයෙන් උත්සාහ ගැනීම ද බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායන්ගේ විකාශයට හා සංවර්ධනයට හේතු වූ බව සිතිය හැකි වේ. විශේෂයෙන් උපනිෂද් ග්‍රන්ථවල දැක්වෙන වේදාන්ත දර්ශනයේ ඉතා සියුම් දාර්ශනික විග්‍රහයන්ට බෞද්ධ පක්‍ෂයෙහි ප්‍රතිචාර දැක්වීම මෙහි දි විශේෂ වේ. අභිධර්මය තුළදී මෙම කාරණය පැහැදිලිවේ. මෙයට අමතරව බෞද්ධ රාමුව තුළ සිටිමින් ඒ ඒ නිකායිකයන් ස්වමතවාදයන් දාර්ශනික ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම තුළින් ද බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායන්ගේ විකාශයට හා සංවර්ධනයට හේතු වී ඇත. (මේධානන්ද හිමි, 1988: 21)

භාරතීය සමයවාදයන් දාර්ශනික පක්ෂයෙන් පෝෂණය වන විට බුදුසමය ද ඒ තත්ත්වයට පාත්‍රවන්නට සිදුවිය. එවැනි තත්ත්වයක් යටතේ අන්‍ය සමයනට අභියෝග කළ හැකි බෞද්ධ දර්ශනයක් බිහිකළේ ථෙරවාදීන් නො ව මහායානිකයෝය. භාරතීය බෞද්ධ ඉතිහාසය තුළ බෞද්ධ දර්ශනය සුළු කාලයකින් ගොඩනැගුනක් නොව ක්‍රමිකව වර්ධනය වූවකි.

## 6.2 සර්වාස්තිවාදී සම්ප්‍රදාය

බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයක් පමණ වන විට ඉන්දියානු ආගමික පසුබිමේ විවිධ වෙනස්කම් සිදුවෙමින් පැවතිණි. මේ වෙනස්කම් බුදුසමයට ද බලපෑවේය. බාහිරින් මූලික බෞද්ධ ඉගැන්වීම් විමර්ශනයට හා විවේචනයට ලක්වන්නට විය. මේ අතර අන්‍ය ආගමිකයෝ න්‍යාය, තර්කනය ආදිය උපයෝගී කර ගනිමින් තම ඉගැන්වීම් ක්‍රමවත්ව තර්කානුකූලව හා බුද්ධිගෝචර වන අන්දමින් ඉදිරිපත් කළ හෙයින් බුදුසමය සදහාද එවැනි ඉගැන්වීම් ක්‍රමයක අවශ්‍යතාව වඩාත් දැනෙන්නට විය. පරියත්තියට නැඹුරු වුව ද භික්ෂූහු මේ සඳහා ක්‍රමවිධි සෙවීමෙහි නිරත වූවෝය. අභ්‍යන්තරයෙන් මෙන්ම බාහිරින් ද එල්ල වුණු විවේචනයන්ට මුහුණ දෙමින් හේතු යුක්ත පිළිතුරු සැපයීම උන්වහන්සේලාට එල්ල වූ ප්‍රධාන අභියෝගයක් විය. ඔවුන්ට මුහුණ පාන්නට සිදුවුණ දාර්ශනික ගැටළු බොහෝමයකට පාදක වූයේ අනාත්ම දෘෂ්ටිය හා ධර්මවාදය ය.

මෙවන් මත ගැටුම් හේතුකොට ගෙන වියත් භික්ෂු පිරිස් තව තවත් ශාස්ත්‍රීය අංශයට නැඹුරු වූහ. උද්ගත වුණු ප්‍රශ්න ආනුභාවික ලෙස නිරාකරණය කර ගත යුතු ඒවා වුව ද පැවති ආගමික වාතාවරණය හා භික්ෂූන්ගේ වැඩි නැඹුරුව අනුව සිදු වූයේ තර්ක විතර්ක මගින් පිළිතුරු සෙවීම කෙරෙහි යොමු වීමය. ධර්ම කරුණු සම්බන්ධයෙන් අභ්‍යන්තරයෙන් මෙන් ම බාහිරින් ද නැගුණු ප්‍රශ්න සඳහා සෘජු, ප්‍රායෝගික, බුද්ධිගෝචර, තර්කානුකූල පිළිතුරු සෙවීම අත්‍යවශ්‍ය විය. අභිධර්මයෙන් ඉදිරියට පැමිණි පරියත්ති නැඹුරුව හා ශාස්ත්‍රීය ව්‍යායාමය මෙවන් වාතාවරණයක් තුළ සීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. තර්ක, විතර්ක, සූත්‍ර පාඨ ආදිය උපයෝගී කොට ගනිමින් පුද්ගලවාදය හුදු ආත්මවාදයන් සේ හංවඩු ගසා ප්‍රතික්ෂේප කිරීම මේ භික්ෂු පිරිස්වලට එතරම් අපහසු කාර්යයක් නොවුව ද ධර්මය පිළිබඳව උද්ගතව තිබූ ප්‍රශ්නයන්ට වඩා හේතු යුක්ත විසඳුම් ඉදිරිපත් කිරීම නම් පහසු වූ බවක් නොපෙනේ. වාත්සිපුත්‍රයින්ගේ පුද්ගලවාදය බුද්ධ දේශනයට පටහැණි ආත්ම වාදයන් නම් මූලික බෞද්ධ ඉගැන්වීම් හා අනාත්ම දර්ශනය සුසංයෝග කළ හැකි වන්නේ කෙසේ ද? යන ප්‍රශ්නයට විසඳුම් සෙවීම ඔවුනට අනිවාර්ය විය. මේ විසඳුම් සෙවීමේ තවත් එක් සුවිශේෂී ප්‍රතිඵලයක් ලෙසින් සර්වාස්තිවාදය නමින් ගුරුකුලයක් බිහි විය.

මුල් කාලීනව සසර දුක් නිවීම අරමුණු කරගෙන බොහෝ දෙනා ශාසනයනට එකතු වූව ද පසුකාලීනව ලාභ අපේක්ෂාවන් අරමුණු කොටගෙන ශාසනයට ඇතුළු වූ නොයෙක් පුද්ගලයන් නිසා බුද්ධ ශාසනයේ ගැටළුකාරී තත්ත්වයන් උද්ගතවිය.

බුදුරජාණන් වහන්සේ විනය නීතීන් පනවමින් ශාසනය ආරක්ෂා කිරීමට පියවර ගත්හ. ශාසනයේ භික්ෂූන් තුළ පැවති මතිමතාන්තර නිසා දෙවැනි ධර්ම සංගායනාවෙන් අනතුරුව භික්ෂූන් ක්‍රම ක්‍රමයෙන් අටළොස් නිකායකට විසිරී ගියේය. ඒ අනුව ථෙරවාදයෙන් බිඳීගිය නිකායක් වශයෙන් සර්වාස්තිවාදය දැක්විය හැකිය.

සර්වස්තිවාදී නිකායිකයෝ ස්ථවිරවාදීන්ට ඉතා නුදුරුව සකුබස හැදෑරූහ. ඉන්දියාවේ ස්ථවිරවාදීන්ගේ බිඳ වැටීමත් සමඟම මෙම නිකාය මහායාන මතධාරීන්ට විරුද්ධව ක්‍රියා කළේය. අභිධර්ම කෝෂය කළ වසුබන්ධුගේ සොයුරු වූ අසංගගේ බලපෑම නිසා වසුබන්ධු මහායාන මතධාරියෙක් වීමට පෙර සර්වාස්තිවාදයේ බලවතෙක් විය. මෙම නිකාය ඉන්දියාවේ පංජාබ් දේශයේ හා උතුරු බටහිර දිශාවන්හි (පකිස්ථානය) පැතිර ගොස් ඇත. (ඒකනායක, බු.ව. 2525: 18)

අභිධර්මය මූලික කරගනිමින් මෙම සම්ප්‍රදාය තම අනන්‍යතාව තාර්කිකව ඉදිරිපත් කරනු ලබයි. සර්වස්තිවාදීහු කාශ්මීරය මුල් කරගනිමින් තම සම්ප්‍රදාය ව්‍යාප්ත කළහ. **'සර්වං සර්වදා අස්ථි'** (සියල්ල සදාකල් පවතී) යන මෙම වදන මත පදනම්ව සර්වස්තිවාදය යන්න නිර්මාණය වී ඇත. ඇතමුන් ප්‍රකාශ කරන්නේ අභිධර්ම මහා විභාෂාවන්හි ඇතුළත් ධර්ම පර්යායන් පිළිගනිමින් එය ගුරුතන්හිලා සළකන ලද බැවින් මොවුන් සර්වස්තිවාදීන් වන බවයි. මොවුන් සියලුම ධර්ම කරුණු කෙරෙහි තියුණු බුද්ධිමය ආකල්පයක් දක්වන අතරම පැනනගින සියලු ප්‍රශ්න තර්ක මගින් නිරාකරණය කරගැනීමට දැඩි උත්සාහයක නිරත වෙයි.

මෙම කරුණු වලින් ප්‍රකට වනුයේ වෛභාෂික අදහස් පිළිගත් බොහෝ සම්ප්‍රදායන් පැවති බවයි. ස්ථවිරවාදීන් සෙයින්ම ජනප්‍රියත්වයට පත්වූ සම්ප්‍රදායක් වශයෙන් සර්වස්තිවාදී සම්ප්‍රදාය පෙන්වා දිය හැකිය. විශේෂයෙන් අන් මතයන්වල සාවද්‍යතාවන්ට එරෙහිව නැගී සිටි පුද්ගලවාදය ප්‍රතික්ෂේප කළ සම්ප්‍රදායක් වශයෙන් සර්වස්තිවාදී සම්ප්‍රදාය හැඳින්වීමට පුළුවන.

### 6.3 සෞත්‍රාන්තික සම්ප්‍රදාය

සර්වාස්තිවාදීන්හු න්‍යාය, තර්කනය ආදිය උපයෝගී කොට ගෙන මුල් බුදු සමයේ මූලික ඉගැන්වීම් ඉතා සියුම් ලෙස විග්‍රහ කරමින් පැන නැගි ප්‍රශ්නවලට මුහුණදෙමින් නව අර්ථකථන සැපයූහ. මේ නව අර්ථකථන හේතුකොට ගෙන බෞද්ධ චින්තනය තවත් අපූර්ව පැතිකඩක් දක්වමින් වර්ධනය වන්නට වූ අතර මෙම වර්ධනය බුදු සමයේ නව ප්‍රවණතා බිහිකිරීමට ද උපස්ථම්භක විය. මෙලෙස බිහි වුණු තවත් එක් නව ප්‍රවණතාවක් සෞත්‍රාන්තික සම්ප්‍රදාය වශයෙන් ප්‍රසිද්ධියට පත් විය. සාම්ප්‍රදායික සර්වාස්තිවාදීන් කෙරෙහි දක්නට ලැබුණු දැඩි අද්‍රානග්‍රාහී ආකල්පය හේතුකොට ගෙන මෙම ගුරු කුලය දෙකකට බෙදී ගියේය. සර්වාස්තිවාදී මත සම්පූර්ණයෙන් පිළිනොගත් තවත් භික්ෂු පිරිස් වෙනත් ගුරු කුල පිහිටුවා ගත්හ.

*ISSN: 3121-5033*

මහීශාසක, කාශ්‍යපීය ආදී ගුරුකුල එසේ බිඳී ගිය භික්ෂු පිරිස් විසින් පිහිටුවා ගන්නා ලද ගුරු කුල ලෙස හඳුනාගත හැකිය. මෙලෙස බිඳී ගිය භික්ෂු පිරිස් අතරින් පසු සමයක වඩාත් බලවත් වූයේ සෞත්‍රාන්තික නමින් ප්‍රසිද්ධියට පත් පිරිස්ය.

සෞත්‍රාන්තික ගුරු කුලයේ පුරෝගාමීන් ලෙස සැලකෙන්නේ දර්ෂ්ටාන්තිකයින් වශයෙන් හැඳින්වුණු භික්ෂු පිරිස් ය. බුද්ධ දේව, ධර්මත්‍රාත නම් වැනි වියත් ආචාර්යවරුන් දර්ෂ්ටාන්තිකයින්ගේ නායකයින් සේ කටයුතු කළ බව සැලකේ. දිගින් දිගටම පවත්නා භවයෙන් භවයට සංක්‍රමණය වන ඒක රස ස්කන්ධය නමින් හැඳින්වුණ ස්කන්ධකයක් පිළිබඳ විශ්වාස කළ හෙයින් සංක්‍රාන්තිකවාදීන් නමින් හැඳින්වුණු තවත් සුළු ගුරු කුලයක් ද සෞත්‍රාන්තික නිකායේ වර්ධනයට හේතු වී යැයි පිළි ගැනේ. දර්ෂ්ටාන්තිකයින් හෝ සංක්‍රාන්තිවාදීන් සෞත්‍රාන්තිකයින් හා අනන්‍ය නොවූව ද මෙම ගුරු කුල දෙකේ ආභාසය සෞත්‍රාන්තිකයින්ට ලැබී ඇතැයි පිළිගැනීම හේතු යුක්ත සේ ය. (නානායක්කාර, 2003: 76)

සෞත්‍රාන්තික ගුරු කුලය මෙනමින් කල එළියට පත් වූයේ කුමාරලාත නොහොත් කුමාරලබ්ධ නම් ආචාර්යවරයාගේ පුරෝගාමීත්වයෙන් බව සාමාන්‍ය පිළිගැනීමයි. මෙලෙස මෙම ගුරු කුලය ප්‍රබල තත්ත්වයකට පත්වන්නට ඇත්තේ ක්‍රි. ව. 2 වන සියවසේදී පමණ යැයි ද වියතුන්ගේ මතයයි. ඊට මඳ කලකට පෙර සැකසුණු අභිධර්ම මහාවිභාෂා ශාස්ත්‍ර නම් සාර්වාස්තිවාදී අටුවා ග්‍රන්ථයේ ද සෞත්‍රාන්තික යන්න සඳහන් වී නොතිබීම මෙම ගුරු කුලය ස්වාධීනව ප්‍රකට වූයේ ක්‍රි.ව. 2 වන සියවසේදී පමණ යැයි නිගමනය කිරීමට තුඩු දෙන සාක්ෂියක් ලෙස ඉදිරිපත් කෙරේ.

සෞත්‍රාන්තික යන නම සෑදී ඇත්තේ සුත්‍රාන්ත + ඉක යන පදයන්ගේ එකතුවෙනි. මෙයින් අදහස් කෙරෙන්නේ මොවුන් සූත්‍රාන්ත පිළිගත් අය යන්නය. මෙම ගුරු කුලය මේ නමින් හැඳින්වූයේ එහි අනුගාමිකයින් සූත්‍රයන් පමණක් ප්‍රාමාණිකකොට සැලකූ හෙයිනි. සෞත්‍රාන්තිකයින් සර්වාස්තිවාදීන්ගෙන් වෙනස් වන ප්‍රධාන හේතුව පැහැදිලි කරන යශෝමිත්‍ර ආචාර්යවරයා සිය ස්ඵුටාර්ථ අභිධර්මකෝශ ව්‍යාඛ්‍යාවෙහි දක්වන්නේ 'යෙ සූත්‍ර ප්‍රමාණිකාඃ න ශාස්ත්‍ර ප්‍රමාණිකාඃ තෙ සෞත්‍රාන්තිකා' යනුවෙනි. යමෙක් සූත්‍ර ප්‍රාමාණිකයෝ වෙත් ද ශාස්ත්‍ර ප්‍රාමාණිකයෝ නොවත්ද ඔවුහු සෞත්‍රාන්තිකයෝ ය. මෙලෙස බිහි වූ සෞත්‍රාන්තික සම්ප්‍රදාය නව ප්‍රවණතාවක් වශයෙන් ප්‍රසිද්ධියට පත් විය.

### 6.4 මාධ්‍යමික සම්ප්‍රදාය

සියළු ආකාරයේ දාර්ශනික අන්තගාමීත්වයෙන් මිදී මධ්‍යම ප්‍රතිපදාවෙහි පිහිටා සිය සිද්ධාන්ත ඉදිරිපත් කරණු ලබන මාධ්‍යමික දර්ශනය චතුර්විධ බෞද්ධ සම්ප්‍රදායන්ගෙන් එක් දාර්ශනික සම්ප්‍රදායකි. බුද්ධ පරිනිර්වාණයෙන් සියවසකින් පසු ධර්මාශෝක රාජ්‍ය සමය දක්වා සිදු වූ අටළොස් නිකායන්ගේ සම්භවයත් සමග ථෙරවාදීන්ගේ බලය ක්‍රමයෙන් හීන වී විවිධ නිකායාන්තර මතවාදයන් දියුණු විය.

*ISSN: 3121-5033*

විශේෂයෙන් මෙම කාල පරාසය තුළ දී මහායානිකයන් සිය මතවාදයන් විශාල ලෙස දියුණු කළෝය. එහි දී මාහායානිකයන් බුද්ධ වචනය විමුක්ති මාර්ගයක ස්වරූපයෙන් මිදී දර්ශනයක ස්වරූපයක් ගැන්වීමට උත්සාහ ගෙන ඇත. (මේධානන්ද හිමි, 1988: 18)

ථේරවාදීන්ගේ ගතානුගතික අදානග්‍රාහි කල්පනාවන්ගෙන් හා දැඩි ක්‍රියාමාර්ගවලින් නිදහස ලැබ ස්වාධීනව සියුම් ලෙස චින්තනය මෙහෙයවන්නට පෙළඹුණු විවිධ නිකායික බෞද්ධාචාර්යවරු බුදු දහමේ මූලික ඉගැන්වීම් පාදක කොට ගෙන විවිධ දර්ශන හා චින්තා නිපදවීය. පටිච්ච සමුප්පාදය පාදක කොටගත් මූලික බුදුදහම මේ ආකාරයට පසුකාලීනව විවිධ බෞද්ධ පඬිවරුන් විසින් තව දුරටත් පුළුල් කරන ලදි. පසුකාලීන බෞද්ධ දර්ශනය කෙරෙහි සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරන මාධ්‍යමික දර්ශනය සමස්ත මහායාන ධර්මයේම පදනම ගොඩ නගන්නකි. මාධ්‍යමික දර්ශනයේ ප්‍රභවයට තුඩු දුන්නේ යැයි සිතිය හැකි මූලික කරුණු දෙකක් දැකිය හැකිය.

- ❖ මහායානිකයන්ගේ ප්‍රඥා පාරමිතා සාහිත්‍යයෙහි ආගමික සංකල්පයක ස්වරූපයෙන් කෙටි සූත්‍රවලින් ඉදිරිපත් කරන ලද ශූන්‍යතාව පිළිබඳ විස්තරවලට දාර්ශනික ස්වරූපයක් ලබා දීමට දරන ලද උත්සාහය
- ❖ අන්‍ය සාම්ප්‍රදායික බෞද්ධ දාර්ශනිකයන් විසින් කරන ලද දාර්ශනික විග්‍රහයන්හි විවිධ මූල ධර්මමය ඌනතාවන් දැක්වීමේ අවශ්‍යතාව. විශේෂයෙන්ම සර්වාස්තිවාදීන්ට සහ සෞත්‍රාන්තිකයන්ට පිළිතුරු දීමට දරන ලද උත්සාහය. (මේධානන්ද හිමි, 1988: 52) වශයෙනි.

මහායාන බෞද්ධ දර්ශනයෙහි ඉතා වැදගත් කේන්ද්‍රීය ස්ථානය දරණුයේ මාධ්‍යමික සම්ප්‍රදායයි. මහායානික සෑම ආගමික චින්තනයකටම මාධ්‍යමික දර්ශනයෙහි විශේෂ බලපෑමක් දක්නට ලැබීම එයට එක් හේතු සාධකයක් වශයෙන් දැක්විය හැකිවේ. මාධ්‍යමික දර්ශනය ගොඩනගා ඇති පදනම ඉතා ගැඹුරු තර්ක ක්‍රමයක් මත පදනම් වී ඇත. එක්තරා ආකාරයක අපෝහක වාදයක් ලෙස සැලකිය හැකි මෙම තර්ක ක්‍රමය හේතු කොටගෙන මාධ්‍යමික දර්ශනය ඉතාමත් බුද්ධි ගෝචර තර්කයට සම්බන්ධ වූ දර්ශනයක් ලෙස අගය කළ හැකිවේ. මාධ්‍යමික දර්ශන සම්ප්‍රදාය බිහි වුයේ ද තත්කාලීන බෞද්ධ දර්ශන සම්ප්‍රදාය තුළ ඉස්මතුව තිබූ ආගමික හා දාර්ශනික අවශ්‍යතා රැසක් සපුරාලීම අරමුණු කරගෙන ය. ඒ සඳහා මුල් බුදු සමයෙන් ද අවශ්‍ය නිදහස ලබා දී තිබුණු අයුරු දැකිය හැකිය. "තථාගතප්පවේදිතො ධම්ම විනයො භික්ඛවේ විවටො විරොචති, නො පටිච්චන්නො" යනුවෙන් බුද්ධ දේශනාවේ දැක්වේ. (තික නිපාතය, 2004 : 510)

මේ අවසරය මත භික්ෂූහූ ධර්මය බැබළවීමේ අරමුණින් විවිධ පර්යායන්ගෙන් ධර්මය විග්‍රහ කිරීමට කටයුතු කළහ.

අනුගමනය කරන්නට යෙදුණු මෙම ක්‍රමය නිසා තෙවන ධර්ම සංගායනාව අවස්ථාව වන විට ධර්මය පිළිබඳ විවිධ මත දැරූ භික්ෂූන් පිරිස කණ්ඩායම් 18ක් දක්වා වර්ධනය විය. තවදුරටත් විකාශය වී යාමේ ප්‍රතිඵලයක් වශයෙනි. දෙවන ධර්ම සංගායනා අවස්ථාවේ මහාසාංඝික නමින් භින්න වූ කණ්ඩායමින් මාධ්‍යමික දර්ශනය ගොඩනැගෙන්නේ, ශාස්වත උච්ඡේද අන්ත දෙකට හෝ අස්ති නාස්තිවාද දෙකට හෝ නොගොස් ශූන්‍යතාවාදය පිළිගත්තෝ මාධ්‍යමිකයෝ ය. මේ සම්ප්‍රදායේ ආදි කර්තෘවරයා නාගර්ජුන පාදයෝය. ශූන්‍යතාවාදය කිසිදු අන්තයකට නොගිය මධ්‍යම ප්‍රතිපදාව යැයි කියති. කිසිදෙයක ස්ථිර තත්ත්වයක් නැත. සියල්ල විච්ඡින්න ප්‍රවාහයකි. මේ දර්ශනය ප්‍රතීත්‍ය සමුත්පාදය පදනම් කොට ගොඩ නැගුණකි. (රාහුල හිමි, 1963: 70)

පටිච්චසමුප්පාදයේ ඇති වැදගත්කම ථෙරවාදී බෞද්ධ ධර්මය සඳහා පමණක් නොව සමස්ත බෞද්ධ දර්ශන විකාශය හා මුල් බුදුසමය සමඟ තේරුම් ගත යුතු ය. ශූන්‍යතාවාදයේ ප්‍රමුඛම ආචාර්යවරයකු වූ නාගාර්ජුනපාදයන් විසින් මුලින්ම බුදුරදුන් පටිච්චසමුප්පාදයේ උපදේශකයාණන් වහන්සේ වශයෙන් ඉදිරිපත් කර ඇත. පටිච්චසමුප්පාදය මතම ඔහු විසින් ශූන්‍යතාවාදයේ අඩිතාලම දමා ඇත.

"සියල්ල සාපේක්ෂක වේ. අන්‍යෝන්‍ය උපකාරීත්වයෙන් යුක්ත වේ. එසේ නම් ලොව සියල්ල ශූන්‍ය වේ. බුද්ධ දේශිත පටිච්ච සමුප්පාදය ඇසුරින් මෙම සාපේක්ෂතාවාදය බෞද්ධ සිද්ධාන්තයක් ලෙස විග්‍රහ කර දක්වන මාධ්‍යමිකයෝ සංකල්ප ශූන්‍යතාවක් කරා ගමන් කරති." (වික්‍රමසිංහ, 1995: 34)

වෛදික චින්තන ධාරාව වැටි වැටි නැගිටින විට අවෛදික චින්තන ධාරාව යම් පසුබෑමකට ලක් විය. එවිට ධර්ම සංකල්පයේ උද්දීපනයක් ඇති වූ අතර ඇතැම් බෞද්ධ හා ජෛන මත ඛණ්ඩනය කිරීමට හින්දූන් විසින් උත්සාහ කරන ලදී. බෞද්ධ නොවන අය අනිත්‍යාදී සංකල්ප ප්‍රතික්ෂේප කළ අතර ජෛනයෝ පවා මේ සඳහා තර්ක ඉදිරිපත් කරන්නට විය. එසේ ම මෙම කාලයේ දී ඇති වූ ප්‍රධාන ලක්ෂණ දෙකක් ලෙස සත්වාද හා අසත්වාද බෙදීම දැක්විය හැකි ය. සත්වාදය මගින් සදාතනික පදාර්ථයක් ඇත යන අධිභෞතිකවාදයක් ඉදිරිපත් වූ අතර දෛවතවාදය ලෙසින් ද හැඳින්වෙන මෙය වෛදික, ජෛන, උපනිෂද් ආදි ආගම්වල එන මතය ලෙස ද දැක්වෙයි. බෞද්ධ සූත්‍රවල එන 'අඤ්ඤං ජීවං අඤ්ඤං ශරීරං' යන්න මෙහි මුල් අවස්ථාව ලෙස පෙනේ. ආත්ම පරිශෝධනය නම් වූ මෝක්ෂ සඳහා ගමන් කළ යුතු මාර්ගය අත්තකිලමතානුයෝගයයි. එමගින් ආත්මයේ ස්වතන්ත්‍රය සාක්ෂාත් කළ යුතු අතර එය බුදුන් වහන්සේ අනාර්ය වූවක් ලෙස දක්වා ප්‍රතික්ෂේප කර ඇත.

අසත්වාදය ලෙසින් ඉදිරිපත් වන්නේ ලෝකය පිළිබඳ භෞතිකවාදී විවරණයකි. මෙයින් පුද්ගලයාගේ ශරීරය හා ආත්මය එකක් ලෙස විවරණය වෙයි. 'තං ජීවං තං ශරීරං' යනුවෙන් මුල් බුදුසමයේ දී දස අව්‍යාකත ලෙස බැහැර කර තිබේ.

භෞතිකවාදීහු මරණයේ දී විනාශ වන ආත්මයක් පිළිබඳ විශ්වාස කළ අතර පුද්ගලයා තම ක්‍රියාවන්ට වග නො කිව යුතු මෙන් ම කර්මය, පුනර්භවය ආදී සංකල්ප බැහැර කරති. මේ ආකාරයෙන් වර්ධනය වූ මෙම සත්වාදය හා අසත්වාදය මාධ්‍යමික දර්ශනයේ බිහිවීමට ප්‍රබල ලෙස බලපා ඇත. (පඤ්ඤාරතන හිමි, 2008: 62-63)

මෙම සත්වාද අසත්වාද වර්ධනයට අමතර ව මාධ්‍යමික දර්ශනයේ බිහිවීමට බලපෑ ප්‍රධාන හේතුවක් ලෙස හින්දූන්ගේ ෂඩ් දර්ශනය පෙන්වා දිය හැකිය. බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු පිතෘ ඝාතක රාජ පරම්පරවේ ආගමනයත් සමග බුදුසමයේ යම් පරිහාණියක් ඇති විය. මේ අතර වාරයේ හින්දූන් විසින් ෂඩ් දර්ශනයක් ඉදිරිපත් කළහ. හින්දූ සමය තුළ වූ අඩුලුහුඬුකම් මගහරවා ගෙන දාර්ශනික ස්වරූපක් ගැනීම මෙයින් බලාපොරොත්තු වී ඇත.

1. ගෞතම අක්ෂපාදයන්ගේ න්‍යාය දර්ශනය

2. පතඤ්ජලීගේ යෝග දර්ශනය

3. කපිලගේ සාංඛ්‍ය දර්ශනය

4. උද්දාලගේ වෛශේෂික දර්ශනය

5. ජෛමිනීගේ කර්ම (පූර්ව) මීමංසා දර්ශනය

6. බදාරයනගේ අපර (උත්තර) මීමංසා දර්ශනය

එම ෂඩ් දර්ශනය ලෙස පෙන්වා දිය හැකි ය. (පඤ්ඤාරතන හිමි, 2008: 62-63) මෙමගින් ඇති කරන ලද නව අර්ථකථනයන් සඳහා මුල් බුදුසමයේ එන ඉගැන්වීම් ප්‍රමාණවත් නො වේ යැයි තත්කාලීන භික්ෂූන් තුළ වූ සිතිවිල්ල නිසා මුල් බුදුසමයෙන් ප්‍රතික්ෂේප කරන ලද තර්කය උපයෝගී කරගෙන ධර්ම විශ්ලේෂණය කිරීමට ගන්නා ලද උත්සාහයක් ලෙස මෙම මාධ්‍යමික ආදී දර්ශන සම්ප්‍රදායන් බිහිවීමට බලපා ඇති බව පෙන්වා දිය හැකි ය.

### 6.5 යෝගාචාර සම්ප්‍රදාය

''යෝගාචාර සම්ප්‍රදාය'' ලෙස අදහස් කරනු ලබන්නේ යථාභූත ඥානදර්ශනය පිණිස යෝගයත්, ආචාරයත් අවශ්‍ය යැයි සලකන පිරිසයි. මෙහි ''යෝගය" නම් යෝනිසෝමනසිකාරයයි. එනම් යම් දෙයක් පිළිබඳව සිහිනුවණින් යෙදී සියුම් ලෙස ගැඹුරට කල්පනා කිරීමයි. ''ආචාරය'' යනු පරතෝඝෝෂයයි. එනම් ගුරුන්ගෙන් අසා දැනගැනීමයි. එසේ ගුරුන්ගෙන් ලබාගත් යහපත් උපදෙස් නොවෙනස්ව එලෙසම ආරක්ෂා කරගෙන ක්‍රියා කිරීමයි. ගුරුභාෂිතය විපරීත නොකොට පිළිගැනීමයි. මෙලෙස යථාර්ථ ඥානදර්ශනය සඳහා වීමංසන බුද්ධිය හෙවත් යෝගයත් ගුරු උපදේශය හෙවත් ආචාරයත් පිළිගන්නෝ යෝගාචාර නම් වෙති.

ක්‍රි. ව. 4වන සියවසේ නව බෞද්ධ චින්තන සම්ප්‍රදායක් ලෙස යෝගාචාර සම්ප්‍රදාය කරලියට පැමිණෙයි. මෙය ප්‍රභවය වීමට තුඩුදුන් ප්‍රධාන හේතු සාධක දෙකක් ඇති බව දේවාලේගම මේධානන්ද හිමියෝ සිය 'චතුර්විධ බෞද්ධ සම්ප්‍රදාය' නැමැති කෘතියේදී දක්වති. එම හේතු දෙක මෙසේය.

1. මහායාන බෞද්ධයන් විසින් බුද්ධ දේශනාවක් ලෙස සම්භාවනීයත්වයෙන් සලකන එම ධර්මයෙහි සාරය ඇතුළත් ඉතා වැදගත් සූත්‍රයක් වූ ලංකාවතාර සූත්‍රයෙහි ඇතැම් කොටස් දාර්ශනික වශයෙන් වැඩිදියුණු කිරීමෙන් යෝගාචාරීන්ගේ විඥානවාදය පහළ වී යැයි සළකනු ලැබේ.

2. "දීර්ඝ කාලයක් තිස්සේ වනගතව යෝගාභ්‍යාසයන්හි (භාවනාවන්හි) නිරතව අති සූක්ෂ්ම ලෙස මිනිස් සිත පිළිබඳ විමර්ශනයෙහි නියුක්තව සිටි යෝගීහු තමන් අවබෝධ කළ සතය්‍ය දාර්ශනික සිද්ධාන්තයක් බවට පෙරලීමෙන් විඥානවාදය බිහිකළහ යැයි ද කියවේ." (මේධානන්ද හිමි, 1988:18)

මෙහි දී මූලිකවම මෙම සම්ප්‍රදාය බිහි වීමට තුඩුදුන් හේතුව ලෙස සලකනු ලබන්නේ ලංකාවතාර සූත්‍රයෙහි ඇතැම් ධර්ම කොටස් ය. මෙය විමසිය යුත්තකි. ලංකාවතාර සූත්‍රයේ සඳහන් වන්නේ විඥානයේ ස්වරූපය, සාමාන්‍ය අත්දැකීම්වල පහළ වීම සහ එහි බුද්ධත්වාවබෝධයට ඇති හැකියාව ආදී කරුණු රාශියකි. යෝගාචාර සම්ප්‍රදාය තුළ ද විඥානවාදය ප්‍රමුඛ කරගන්නා අතර එහිදී තම දර්ශනවාදය පෝෂණය කිරීමට ලංකාවතාර සූත්‍රය කදිම තෝතැන්නක් කරගත් බව යෝගාචාර සම්ප්‍රදාය සහ ලංකාවතාර සූත්‍රය අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වෙයි. එයට නිදසුනක් ලෙස ආලය විඥානය සම්බන්ධව ලංකාවතාර සූත්‍රයෙහි සඳහන් ශ්ලෝකයක් මෙලෙස දැක්විය හැකි ය.

> "තරංගාහි උදධේර් යද්වත් පවන ප්‍රත්‍යයෙර්රිතාඃ
> නෘත්‍යමානාඃ ප්‍රවර්තන්තේ ව්‍යච්ඡේදශ්ච න විද්‍යතේ
> ආලයෞඝස් තථා නිත්‍යං විෂය පවනේරිතඃ
> චිත්‍රෛස්තරංග විඥානෛර් නෘත්‍යමානඃ ප්‍රවර්තතේ"

සුළඟින් මෙහෙයවන ලදුව සාගරයේ ජලතරංග යම් සේ නටමින් පවතිත්ද, අතරක් නැතිව හෙවත් අඛණ්ඩව ඒවා රඟ දක්වමින් පවතීද, ආලය විඥානය නැමති සාගරයටද එලෙසින්ම ඉන්ද්‍රිය ගෝචර විෂය අරමුණු නැමැති පවනින් මෙහෙයවන ලදුව විසිතුරු විඥාන තරංග මගින් නටනු ලැබෙමින් පවතී." (ධම්මජෝති හිමි, 2011 : 23)

මෙහි ආලය විඥානය නැමැති සංකල්පය යෝගාචාර සම්ප්‍රදායයෙහි ගැඹුරින් සාකච්ඡා කෙරෙන සංකල්පයකි. මෙය ලංකාවතාර සූත්‍රය දියුණු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දැකිය හැකි වේ. මීට අමතරව යෝගාචාර සම්ප්‍රදායෙහි ප්‍රභවයට මුල් බුදු සමයේ බලපෑමද ලැබී ඇති බව උගත් මතයයි.

යෝගාචාර ඉගැන්වීම්වල බීජ අවස්ථාව ත්‍රිපිටකයෙහි ඇති බවට කරුණු දක්වන කපිල අභයවංශ මහතා මෙවැනි අදහසක් ඉදිරිපත් කරයි.

පූර්ණ වශයෙන් වර්ධනය වූ විඥානවාදයක් ආදි බුදු සමයෙහි අවිද්‍යමානය. එහෙත් සත්ව පුද්ගල වස්තු සම්බන්ධ වූ ලෝකය අරහයා ඉදිරිපත්වන ආදි බෞද්ධ චින්තනයෙහි විඥානවාදී විවරණ කොතෙකුත් දක්නට ඇත. විඥානයට ලැබුණ ප්‍රමුඛත්වයත් විෂය ලෝකයෙහි නිස්සාරත්වය දැක්වීමට දරන ප්‍රයත්නයත් ආදි බුදු සමයෙහි ප්‍රකටය. (මේධානන්ද හිමි, 1988: 18) මෙලෙස විඥානවාදී ඉගැන්වීම් මුල් බුදු සමය තුළද ඉගැන්වෙන අතර ආලය විඥානය සම්බන්ධ මූල බීජ අවස්ථාවක් අංගුත්තර නිකායෙන් හමුවෙයි.

''ආලය රාමා භික්ඛවේ පජා ආලය රතා ආලය සමුදිතා සා තථාගතේන අනාලයේ ධම්මේ දේසියමානේ සුස්සුසති සෝතං ඔදහති අඤ්ඤචිත්තං උපට්ඨාපෙති තථාගතස්ස භික්ඛවේ අරහතො සම්මා සම්බුද්ධස්ස පාතුභාවා අයං පඨමො අච්ඡරියෝ අබ්භුතෝ ධම්මෝ පාතුභවති.'' (අභයවංශ, 1995: 45) මෙලෙස මුල් බුදු සමයෙහි එන ආභාසය තුළින් ද යෝගාචාර සම්ප්‍රදාය ප්‍රභවය ලද බවද පිළිගත් මතයකි. මීට අමතරව පසුකාලීන දර්ශනවල බලපෑම ද මෙහි ප්‍රභවයට තුඩුදුන් බව සාමාන්‍ය පිළිගැනීමයි.

ආදි බුදුදහමේ එන ප්‍රවණතා පමණක් නොව සෞත්‍රාන්තික ඉගැන්වීම් යෝගාචාරයේ ප්‍රභවයට ඍජුවම බලපා ඇතැයි සාමාන්‍ය පිළිගැනීමයි. සෞත්‍රාන්තික ගුරුකුලයේ ප්‍රධාන ඉගැන්වීම් වශයෙන් ඇති බීජ සංකල්පයත්, එමෙන්ම එම ගුරුකුලය මගින් ඉන්ද්‍රිය සංජානනය සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරෙන බාහ්‍යාර්ථානුමේයවාදයත් යෝගාචාරයේ ප්‍රභවයට ඍජුවම බලපා ඇතැයි බොහෝ විද්වත්හු පෙන්වාදෙති. (නානායක්කාර, 2003: 129)

මධ්‍යකාලීන බුදුසමයෙහි මූලික කරුණු නැමැති ග්‍රන්ථයේ මාධ්‍යමිකයන් ඉදිරිපත් කළ ශූන්‍යතාවාදී ඉගැන්වීම්ද යෝගාචාර දර්ශනයේ පදනම සැකසූ බව සඳහන් වෙයි. මෙලෙසින් යෝගාචාර සම්ප්‍රදායෙහි ප්‍රභවයට ලංකාවතාර සූත්‍රයෙහි එන විඥානය පිළිබඳ මූලික ඉගැන්වීම් සමූහයත් ත්‍රිපිටකයෙහි ඇති විඥානය පිළිබඳ අදහස් සමූහයත්, සෞත්‍රාන්තික මාධ්‍යමික ආදී දර්ශන සම්ප්‍රදායනුත්, භාවනාවෙහි යෙදී සිටි ඍෂිවරුන්ගේ සිත පිළිබඳ වූ ඉගැන්වීමුත් බලපා ඇති බව විද්වත් මතය වෙයි.

**07. නිගමනය**

බුදුරජාණන් වහන්සේගේ පරමාර්ථය වූයේ සත්ත්වයා සංසාර දුකින් එතෙර කරවීම ය. ඒ සඳහා වන ධර්මය ප්‍රගුණ කිරීමේ දී විදර්ශනා ධූරය හා ග්‍රන්ථ ධූරය ද ඉවහල් කරගත හැකි බව බුදුන් වහන්සේ දේශනා කළහ. මුල්කාලයේ බොහෝ සෙයින් විදර්ශනා ධූරය ප්‍රගුණ කළ ද පසුකාලීනව භික්ෂූන් විදර්ශනා ධූරයෙන් බැහැර වී ග්‍රන්ථ ධූරය වැඩීමට යොමු වූහ.

තර්කය උපයෝගි කොට ගෙන ධර්ම කරුණු දාර්ශනිකව ඉදිරිපත් කිරිමට ඔවුන් පෙළඹීම සඳහා මුල් බුදුසමයෙන් ලැබී තිබූ නිදහස ද උපයෝගී කර ගත්හ. බුද්ධ පරිනිර්වාණයෙන් පසු ධර්මය ශාස්තෘත්වයෙන් පිළිගෙන ක්‍රියා කිරීමට බෙහෙවින් ක්‍රියා කරන්නට විය. බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ධර්ම සංගායනාවක් පැවැත්වීම මගින් ඒ බව මනාව තහවුරු වන අතර මෙසේ ධර්මය ශාස්තෘත්වයෙන් පිළිගෙන ක්‍රියා කිරිමට කරන ලද දේශනාව ද මෙම සම්ප්‍රදායන් බිහිවීමට ඉවහල් වූ බව පෙනේ. ප්‍රථම ධර්ම සංගායනාවේ දී සංගීතිකාරක තෙරවරුන් විසින් පළමු ව ධර්මය සංගායනා කළ අතර ධර්ම ගෞරවය රැකීම සඳහා බුද්දානුබුද්දක ශික්ෂාපද වෙනස් කිරීමට ලබාදුන් අවසරය ද නොසලකා ඒවා වෙනස් නො කිරිමට තීරණය කළහ. මෙසේ බුද්දානුබුද්දක ශික්ෂාපද වෙනස් කිරීමට ලබාදුන් අවසරය නො තකා ගත් මෙම තීරණය නිකාය භේදයට සෘජුවම බලපාන ලදී. දෙවන ධර්ම සංගායනාව සඳහා බලපෑ දස වස්තුව බිහි වූයේ ද මෙම ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් හේතුවෙනි. මෙසේ ඇති වූ නිකාය භේදය නිසා බෞද්ධ දර්ශනය පිළිබඳ සම්ප්‍රදායන් 04ක් බිහි විය. වෛභාෂික, සෞත්‍රාන්තික, මාධ්‍යමික, හා යෝගාචාර වශයෙනි. එයින් වෛභාෂිකයෝ යැයි කියනු ලබන සර්වාස්තිවාදීහු බුද්ධ පරනිර්වාණයෙන් තෙවැනි ශතවර්ෂයේ ද ඔවුන්ගේම ශාඛාවක් වන සෞත්‍රාන්තිකයෝ සිවුවන ශතවර්ෂයේ ද මාධ්‍යමිකයෝ බුද්ධ පරිනිර්වාණයෙන් පස්වන ශතවර්ෂයේ ද යෝගාචාර නමින් හඳුන්වනු ලබන විඥ්ඥාණවාදීහු ශතවර්ෂ අටකට පමණ පසුව ද බිහි වූහ. වෛභාෂික හෙවත් සර්වාස්තිවාදීහු කාලත්‍රයවර්ති ධර්මයන්ගේ අස්ථිත්වයක් පිළිගත් අතර සෞත්‍රාන්තිකයෝ සූත්‍ර පමණක් ප්‍රමාණ කොට ගෙන අභිධර්මය බුද්ධ භාෂිතයක් නො වන බව ප්‍රකාශ කළහ. මාධ්‍යමිකයෝ ශූන්‍යතාවාදය ඉදිරිපත් කළා සේ ම යෝගාචාරීහු යෝගයත් ආචාරයත් පිළිගෙන යථාර්ථඥානය ලැබීමට යෝගයන්හි හැසිරිය යුතු බව ප්‍රකාශ කළ බව පෙනේ.

## 08. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

**ප්‍රාථමික මූලාශ්‍රය**

අං.නි. තික නිපාතය, හරණ්ඩු වර්ගය, (2004) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

**ද්විතීයික මූලාශ්‍රය**

අභයවංශ, කපිල. (1999) බෞද්ධ අධ්‍යයනය, කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
නානායක්කාර, සනත්. (2003) මුල් බුදුදහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්, දෙහිවලඃ ග්ලෝබල් ග්‍රැපික්ස් සහ ප්‍රින්ටින් සමාගම.
මාලනී ඒකනායක, සුමිත්‍රා. නිවන් මග, (බු.ව. 2525). නිකායන්ගේ ව්‍යාප්තිය (සංස්.). ටෙනිසන් පෙරේරා, රජයේ මුද්‍රණාලයීය බෞද්ධ සංගමය.
මේධානන්ද හිමි, දේවාලේගම. (1988). චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය, වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ.මැදවච්චියේ ධම්මජෝති හිමි, (2011) මහායාන මූලික සංකල්ප, මුල්ලේරියාවඃ විජය සූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.
රාහුල හිමි, අත්තුඩාවේ. (1957). බෞද්ධ දර්ශනය, මහරගමඃ සමන් ප්‍රකාශන.
වික්‍රමසිංහ, අනුර එන්. (1995) මහායාන බුදු සමයේ සමකාලීන අදාළත්වය, ඩේවිඩ්සන් ප්‍රින්ටර්ස්.
සාසනරතන හිමි, මොරටුවේ. (1962). ලක්දිව මහායාන අදහස්, කොළඹඃ ඇම්. ඩී ගුණසේන සහ සමාගම.චරණ ශාස්ත්‍රීය සංග්‍රහය, මංගල කලාපය, (2008) (සංස්.). මඩවලතැන්නේ පඤ්ඤාරතන හිමි ආදීහු, සාමුහික භික්ෂු සංගමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය